# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

## නැගිටිමු නැගෙනහිර සංවිධානය (සංස්ථාගත කිරීමේ)

**නැගිටිමු නැගෙනහිර සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු බුද්ධික පතිරණ මහතා විසින්
2021 නොවැම්බර් මස 09 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2021 ඔක්තෝබර් මස 18 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

[87 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 18.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# නැගිටිමු නැගෙනහිර සංවිධානය
# (සංස්ථාගත කිරීමේ)

## නැගිටිමු නැගෙනහිර සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව

"නැගිටිමු නැගෙනහිර සංවිධානය" යනුවෙන් හඳුන්වනු ලබන සංවිධානය පිහිටුවීමත් එම සංවිධානයේ සාමාජිකයින් විසින් එකඟ වනු ලබන රීතිවලට අනුව එම සංවිධානයට සම්බන්ධ සියලු කාරණා හා භාණ්ඩ හුවමාරු කිරීමත් එම සංවිධානය පිහිටුවීමේ අරමුණු හරයාත්මක ව කරගෙන යෑම සඳහාත්:

සහ එම සංවිධානය මෙයින් සාර්ථක ව ස්ථාපිත කරනු ලබනු අතර සංස්ථාගත කරනු ලබන බවත් එය පිහිටුවීමෙන් අරමුණු කරන යම් කාරණා සහ යම් අරමුණු හුවමාරු කරගැනීමටත් ඉදිරියට කරගෙන යාමටත් මෙම සංවිධානය මහජන යහපත සඳහා ද සංස්ථාගත කිරීම සඳහා ඉහත කාරණා අදාළ වේ:

මෙය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙතැන් සිට පහත පරිදි පනවනු ලැබේ

ලුහුඬු නාමය

1. මේ පනත 2021 අංක    දරන නැගිටිමු නැගෙනහිර සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

නැගිටිමු නැගෙනහිර සංවිධානය සංස්ථාගත කිරීම

2. මේ පනත ක්‍රියාත්මක වන දිනයේ සිට නැගිටිමු නැගෙනහිර සංවිධානය (මෙතැන් සිට "සංවිධානය" යනුවෙන් හඳුන්වනු ලබන) සඳහා මෙහි දැක්වන ආකාරයට සාමාජිකයන් ලෙස බොහෝ පුද්ගලයින් බඳවා ගනු ලැබිය හැකි අතර මෙහි පහත දැක්වෙන ආකාරයට නිරන්තර අනුප්‍රාප්තිය වන ආකාරයට පුද්ගල මණ්ඩල සංස්ථාවක් (මෙතැන් සිට "සංස්ථාව" යනුවෙන් හඳුන්වනු ලබන) පිහිටුවනු ලැබිය යුතු අතර, එය එහි නමින් සහ එය විසින් නඩු පවරනු ලැබීමටත්, නඩු පැවරීමටත් හැකි සම්පූර්ණ බලය හා අධිකාරිය ඇති පොදු මුද්‍රාවක් භාවිත කිරීමටත්, සංස්ථාවේ අභිමතය පරිදි එය වෙනස් කිරීමටත් හැකි විය යුතු ය.

සංස්ථාව පිහිටුවීමේ පොදු පරමාර්ථ

3. සංස්ථාව පිහිටුවීමේ පොදු පරමාර්ථ පහත ලෙස ප්‍රකාශ විය යුතු ය:—

(අ) ප්‍රාථමික, ද්විතීයික හා තෘතීයික අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් පාසල් දරුවන්ට සහ විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ට ඔවුනගේ අධ්‍යාපනික කටයුතු සාර්ථකව කරගෙන යාමට අවශ්‍ය පහසුකම් අදාළ ආයතනවලට භෞතිකව සහ ගුණාත්මක ව සපයමින් සහය සහ ආධාර දීම;

(ආ) තාරුණ්‍ය සංවර්ධනය කිරීමේ අරමුණින් අවශ්‍ය මූලික පහසුකම් සැපයීම හරහා පළාත්, දිස්ත්‍රික් හා ග්‍රාමීය මට්ටමින් තරුණයින්ගේ ක්‍රීඩා, භාෂා, කලා හා සංස්කෘතික අංශවලින් ඇති සහජ දක්ෂතා හඳුනාගෙන ඒවායින් සන්නද්ධවීමට පෙළඹවීම;

(ඇ) විෂය බාහිර සහ සංස්කෘතික දක්ෂතා ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් පාසල් සහ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගේ දක්ෂතා ප්‍රචාරය කිරීමට හා අගය කිරීමට තෑගි සහ සහතික ප්‍රදානය කිරීමට අවශ්‍ය පියවර සැපයීම;

(ඈ) විෂය බාහිර ක්‍රියාකාරකම් සහ විෂයානුබද්ධ ක්‍රියාකාරකම් වැඩිකිරීම සඳහා තරුණයින් හට සම්මන්ත්‍රණ සහ ප්‍රායෝගික වැඩසටහන් පැවැත්වීම;

(ඉ) රැකියා විරහිත බව තුරන් කිරීම සඳහා තරුණයින් හට කාලයෙන් කාලයට වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පැවැත්වීම;

(ඊ) පළාත්, දිස්ත්‍රික් සහ ග්‍රාමීය මට්ටමින් මේසන්වරුන්, වඩුකාර්මිකයින් සහ වෙනත් පුහුණු පුද්ගලයින් හට වෘත්තීය පුහුණු පාඨමාලා පැවැත්වීම;

(උ) භාෂා හැකියාවන් වැඩි කිරීමත්, භාෂා දැනුමේ ඇති වැදගත්කම පිළිබඳ ව සහාය වීමත්, උනන්දු කරවීමටත් ප්‍රතිපාදන සැලසීම;

(ඌ) කාන්තා බලගැන්වීමේ අරමුණින් පුහුණු වැඩසටහන්, භාෂා හැකියාව, අවබෝධය වර්ධනය කිරීම හා අධ්‍යාපනය මඟින් කාන්තාවන්ගේ තත්ත්වය ඉහළ නැංවීම;

(එ) සාමාන්‍ය සමාජයේ ජීවන මට්ටම ඉහළ නැංවීම සඳහා ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට, වැන්දඹු කාන්තාවන්ට, අනාථ වූ අයට සහ ආබාධිත තැනැත්තන්ට සහය ලබාදීම;

(ඒ) සාම්ප්‍රදායික සහ අපනයන කෘෂිකර්ම කටයුතුවල නිරත ගොවීන්ට විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් කිරීම මඟින් ඔවුන් දිරිමත් කිරීම;

(ඔ) ධීවර සහ ජලජ සම්පත් සංවර්ධනය කිරීමේ අරමුණු සඳහා ග්‍රාමීය, දිස්ත්‍රික් සහ පළාත් මට්ටමේ ධීවරයින් දිරිගැන්වීම;

(ඕ) මෙම සංස්ථාවේ පරමාර්ථ හා සමාන දේශීය සහ විදේශීය සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම;

(ක) ජනතාවගේ බුද්ධිමය වර්ධනය සඳහා අදාළ වන ශාස්ත්‍රීය සමුළු, සම්මන්ත්‍රණ හා දේශණ ආදිය පැවැත්වීමට අවශ්‍ය මාර්ගෝපදේශ පැවැත්වීම සහ එකී කාර්යයන් සඳහා ප්‍රදර්ශන, අධ්‍යාපනික සහ ප්‍රචාරක කටයුතු සංවිධානය කිරීම;

(ග) සංස්ථාවේ අරමුණු ළඟාකරගැනීම සඳහා මඟ පෙන්වන හෝ ආනුෂංගික වන වෙනත් සියලු කාර්යයන් දේවල් කිරීම.

සංස්ථාවේ බලතල

4\. මෙම පනතේ ප්‍රතිපාදන සහ වෙනත් ඕනෑම ලිඛිත නීතියක ප්‍රතිපාදනවලට යටත්ව සංස්ථාවට පහත බලතල තිබිය යුතු ය:—

(අ) බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ වසාදැමීම;

(ආ) ඇපයක් ඇතිව හෝ නැතිව මුදල් ලබාගැනීමට, රැස්කිරීමට සහ ප්‍රදාන, පිරිනැමීම් ලැබාගැනීමටත්, එකතු කිරීමටත්;

(ඇ) සංස්ථාවේ කළමනාකරණ කමිටුව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි සංස්ථාවේ අරමුණු සඳහා හදිසියේ අවශ්‍ය නොවන සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීම;

(ඇ) සංස්ථාවේ අරමුණු සඳහා අවශ්‍ය විය හැකි ඕනෑම චංචල හෝ නිශ්චල දේපළක් විකිණීම හෝ කුලියට දීම හෝ වෙනත් ආකාරයකින් ලබාගැනීම මඟින් විකිණීම, අත්පත් කරගැනීම, ලබාදීම, එය සංස්ථාවේ අරමුණු ප්‍රවර්ධනය කිරීමේ දක්මකින් යෝග්‍ය වන්නේ යැයි සිතිය හැකි ලෙස නීත්‍යනුකූල වන ආකාරයකින් අරමුණු සඳහා අත්පත් කරගැනීම හෝ බැහැර කිරීම;

(ඉ) සංස්ථාව විසින් තීරණය කරනු ලබන පරිදි සංස්ථාවේ අරමුණු ඉටුකර ගැනීමේ අවශ්‍යතාව පරිදි සේවකයින් පත්කිරීම, සේවයේ යෙදවීම හෝ සංස්ථාව විසින් තීරණය කරනු ලබන පරිදි පාරිතෝෂිකය ගෙවීමෙන් පසු සේවයෙන් ඉවත් කිරීම හෝ කළ හැක;

(ඊ) සංස්ථාවේ අධිකාරිය ලත් ඕනෑම නිලධාරියකුට හෝ නියෝජිතයකුට සෘජුව හෝ එවැන්නෙක් හරහා සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හෝ අරමුණු ඉටුකරගැනීමේ දී අවශ්‍ය වන සියලු ගිවිසුම් සහ එකඟතාවලට ඇතුළත් වීමට හෝ කරගෙන යෑමට හෝ ඉටු කිරීමට හැක;

(උ) කළමනාකරණ කමිටුව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි සංස්ථාවේ කටයුතු කරගෙන යෑමේ දී අවශ්‍ය වන උපදේශන සභා, කමිටු හෝ උපසභා පත්කළ හැක.

එතකදු වුව විදේශ ප්‍රදාන, පිරිනැමීම් හෝ තෑගි සම්බන්ධව මුදල් විෂය භාර අමාත්‍යවරයාට අනුයුක්ත අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අවසරය සංස්ථාව විසින් ලබාගත යුතු ය.

සංස්ථාවේ සම්බන්ධතා කළමනාකරණය

**5.** (1) සංස්ථාවේ සම්බන්ධතා කළමනාකරණය සංස්ථාවේ රීතිවලට අනුකූල විය යුතු ය. සභාපති/ ප්‍රධාන විධායක නිළධාරි, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළුව මෙහි පහත සපයා ඇති රීති පරිදි තෝරා ගනු ලබන තවත් සාමාජිකයන්ගෙන් සමන්විත සාමාජිකයන් හතරකට නොවැඩි කළමනාකරණ කමිටුවක් මඟින් සම්බන්ධතා කළමනාකරණය පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) යම් සාමාජිකයකුගේ නාමයෝජනා හෝ ඡන්දය සම්බන්ධ යම් ගැටලුවක් නිසා හෝ කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්ගේ

පුරප්පාඩුවක් නිසා හෝ යන කාරණා හේතුවෙන් පමණක් ම කමිටුවේ කිසිඳු ක්‍රියාවක් හෝ පවත්වාගෙන යෑමක් ශුන්‍ය වන්නේ නැත.

(3) මෙම පනත ක්‍රියාත්මක වන දින සිටම කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්ගෙන් පළමු සාමාජික කමිටුව සමන්විත විය යුතු ය. මෙම පනතේ 6 වන වගන්තිය යටතේ වන කමිටුවක් පිහිටුවා එය වැඩ බාරගන්නා තෙක් ඉහත කමිටුව කටයුතු කළ යුතු ය.

සංස්ථාවේ රීති

**6.** (1) පහත සියලුම හෝ ඕනෑම කාරණාවක් සම්බන්ධ ව මහ සභා රැස්වීමක දී පැමිණ සිටින සාමාජිකයින් තුනෙන් දෙකකට නොඅඩු බහුතරයක ඡන්දය ඇති ව මෙම පනතේ හෝ වෙනත් ලිඛිත නීතියක හෝ ප්‍රතිපාදනවලට පටහැනි නොවන ආකාරයෙන් කාලයෙන් කාලයට සංස්ථාව විසින් රීති සම්පාදනය කළ හැකි ය.

(අ) සාමාජිකයන් වර්ගීකරණය හා සාමාජිකයින් බඳවා ගැනීම, ඉවත් කිරීම හෝ නෙරපීම;

(ආ) නිලධාරීන් තෝරා පත්කර ගැනීම, බඳවා ගැනීම කරන ආකාරය, ඉවත් කිරීම, සහ ඔවුන්ගේ බලතල කර්තව්‍යය සහ කාර්යයන්;

(ඇ) කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම, එහි බලතල, කාර්යයන් සහ හැසිරීම හා කළමනාකරණ නිලධාරීන්ගේ නිල කාල සීමාව;

(ඈ) සංස්ථාවේ නිලධාරීන්, නියෝජිතයින් සහ සේවකයන්ගේ බලතල, රාජකාරි, කාර්යයන් සහ කර්තව්‍ය;

(ඉ) කළමනාකරණ කමිටුව කැඳවීම, පැවැත්වීම සම්බන්ධ කාර්යය පටිපාටිය, වේලාව, ස්ථානය, දැන්වීම, න්‍යාය පත්‍රය, ගනපූරණය සහ එහි වෙළෙඳ කටයුතු;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය, කළමනාකරණය, එහි අරමුදල්වල භාරය, එහි ගිණුම් විගණනය සහ නඩත්තු කිරීම;

(උ) සංස්ථාවේ සම්බන්ධතා කළමනාකරණය සහ එහි අරමුණු ඉටු කිරීම.

(2) (1) වන උපවගන්තියේ දක්වා ඇති රීති පරිදි රැස්වීමක් කැඳවා සංස්ථාව විසින් සැකසූ ඕනෑම රීතියක් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, එකතු කිරීම හෝ අවලංගු කිරීම කළ හැක.

(3) සංස්ථාවේ සාමාජිකයින් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ සාමාජිකයන්ගේ සාමාජික ලේඛනය

**7.** කළමනාකරණ කමිටුවේ ලේකම් විසින් සංස්ථාවේ සාමාජිකයන්ගේ නම් ඇතුළත් නාමාවලියක් පවත්වාගෙන යා යුතු ය.

සංස්ථාවට චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව

**8.** මෙම පනතේ ප්‍රතිපාදනවලට යටත් ව, සංස්ථාවට මෙම පනතේ අරමුණු ඉටුකරගැනීම සඳහා 6 වන වගන්තියේ ප්‍රතිපාදනවල සංස්ථාවේ රීතිවලට යටත්ව සංස්ථාව විසින් ඕනෑම චංචල සහ නිශ්චල දේපළක් මිලදී ගැනීමකින්, ත්‍යාගයකින්, ප්‍රදානයකින්, තෙස්තමේන්තු නීයාදනයකින් හෝ වෙනත් ආකාරයකින් විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ වෙනත් ආකාරයකින් පැවරීමට හැක.

සංස්ථාවේ අරමුදල

**9.** (1) සංස්ථාවට එයට ම අයත් අරමුදලක් පැවතිය යුතු අතර මෙතැන් සිට සංස්ථාවේ නමින් ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, ප්‍රදාන, පරිත්‍යාග, දායකවීම්, ගෙවීම් ලෙසින් ලැබෙන සියලු මුදල් සංස්ථාවේ කළමනාකරණ කමිටුව විසින් කළින් කලට තීරණය කරන පරිදි ගිණුම් ඇති බැංකුවල (සංස්ථාවේ) අරමුදලට බැර විය යුතු ය.

(2) සංස්ථාවේ දේපළ සංවර්ධනයට, වර්ධනයට හෝ පුනරුත්ථාපනයට යන අරමුණු සඳහා සංස්ථාව විසින් ක්ෂය වන හෝ අඩු වන අරමුදලක් පිහිටුවා ගත යුතු ය.

(3) මේ පනත යටතේ සංස්ථාව විසින් සිය බලතල, කාර්යයන් සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී නිදහස් කිරීමේ දී, පැවැත්වීමේ දී, උද්ගතවන ඕනෑම වියදමක් පියවා ගැනීම සඳහා අරමුදලින් අඩුකරගත යුතු ය.

(4) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

සංවිධානය විසින් ගෙවිය යුතු සහ සංවිධානයට අයවිය යුතු ණය

**10.** මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙර සිට මෙම සංස්ථාවේ සියලු ණය සහ බැරකම් මෙහි පහත දක්වා ඇති ආකාරයෙන් සංස්ථාව විසින් ගෙවිය යුතු ය. දායක මුදල් සහ ග්‍රාහක මුදල් ලෙස සංස්ථාවට ගෙවිය යුතු සියලු ණය මුදල් මෙම පනතේ අරමුණු සඳහා මෙම සංවිධානයට ගෙවිය යුතු ය.

සාමාජිකයන්ගේ බැරකම් සීමා කිරීම

**11.** කිසිදු සාමාජිකයකුට සාමාජික ගාස්තු ලෙස ගෙවිය යුතු වන මුදල හැර සංස්ථාවේ ණය හෝ බැරකම් ගෙවා දැමීම සඳහා හෝ වෙනත් අරමුණක් සඳහා කිසිදු සාමාජිකයෙක් දායක විය යුතු නැත.

ගිණුම් සහ විගණනය

**12.** (1) සංස්ථාව එහි ආදායම් සහ වියදම්, වත්කම්, බැරකම් සහ සංස්ථාවේ සියලු ගනුදෙනු පිළිබඳව නිවැරදි ගිණුම් පවත්වාගෙන යා යුතු ය.

(2) විගණකවරයාගේ සියලු ගිණුම් සුදුසුකම්ලත් විගණකවරයකු විසින් විගණනය කළ යුතු ය.

(3) මේ වගන්තිය යටතේ ''සුදුසුකම් ලත් විගණකවරයා'' යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙකු හෝ නීතියෙන් පිහිටුවනු ලැබූ වෙනත් ඕනෑම ආයතනයක් හෝ මඟින් ගණකාධිකාරිවරයකු ලෙස කටයුතු කළ හැකි සහතික පතක් හිමි ඕනෑම අයෙක්; හෝ

(ආ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙක් වෙමින් ගණකාධිකාරීවරුන්ගෙන් සැදුම්ලත් හෝ නීතියෙන් පිහිටුවනු ලැබූ වෙනත් ඕනෑම ආයතනයක් හෝ මඟින් ගණකාධිකාරිවරයකු ලෙස කටයුතු කළ හැකි සහතික පතක් හිමි ඕනෑම අයෙක් සාමාජිකයන් වන ගණකාධිකාරීවරුන්ගෙන් සැදුම්ලත් සමාගමක් හෝ,

අදහස් වේ.

සංස්ථාවේ මුද්‍රාව

**13.** සංස්ථාවේ සභාපති සහ ලේකම් හෝ සංස්ථාවේ කළමනාකරණ කමිටුව විසින් කුමන අයෙකු ඔවුන්ගේ නම්වලින් අත්සන් කළ යුතු යැයි තීරණය කරනු ලබන වෙනත් සාමාජිකයින් දෙදෙනෙක් සිටින අවස්ථාවක හැර වෙනත් කිසිඳු අවස්ථාවක සංස්ථාවේ මුද්‍රාව කිසිදු ආකාරයකට අමුණනු නොලැබිය යුතු ය. එවැනි අත්සන් කිරීමක් ඕනෑම අයෙකුට සාක්ෂිකරුවකු ලෙස අත්සන් කිරීමේ නිදහස ලැබිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ

**14.** සංස්ථාව විසුරුවා හැරීමක දී යම් දේපළක් ඉතිරි වන්නේ නම් එම දේපළ සියලු ණය සහ බැරකම් පියවා දැමීමෙන් පසු සංස්ථාවේ සාමාජිකයන් අතර නො බෙදිය යුතු ය. එහෙත් මෙම සංස්ථාවේ අරමුණුවලට සමාන අරමුණු ඇති වෙනත් සංස්ථාවකට හුවමාරු කළ හැක. එම සංස්ථාව එහි සාමාජිකයන් අතර, එහි දේපළ හෝ ආදායමක් නොබෙදෙන රීතිවලින් සමන්විත විය යුතු ය. එවැනි සංස්ථා මොනවාද යන්න කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් විසින් මෙම සංස්ථාව විසුරුවා හැරීමක දී හෝ ඊට පෙර තීරණය කළ හැක.

ජනරජයේ සහ වෙනත් අයගේ අයිතිවාසිකම් සුරැකීම

**15.** මෙම පනතේ දක්වා ඇති පරිදි ඉල්ලා සිටිය හැකි, ඔවුන්ගෙන් ඉල්ලිය හැකි හෝ යටත් වන අය හැර යම් දේශපාලන මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ ජනරජයේ හෝ වෙනත් ඕනෑම අයෙකුගේ අයිතීන්වලට මෙම පනතේ කිසිදු ප්‍රතිපාදනයක් බලපාන්නේ හෝ අගතිදායක වන්නේ හෝ නැත.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**16.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.